ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

**පිරිපහදුව - සපුගස්කන්ද**

ඇබෑර්තු

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම පිණිස, ශ්‍රීලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| <u>තනතුර</u> | <u>ශ්‍රේණිය</u> | <u>වැටුප් පරිමාණය</u> |
|---|---|---|
| සහකාර ගිනිහට | බී-4 | රු.99425 - 118950<br>5×1155 :10×1375 |

**පත්වීමේ ස්වභාවය - ස්ථිර පදනම**

<u>තනතුරට අදාළ සුදුසුකම්</u>

1. 1.1 අයදුම්කරුවන් අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 02 ක් සහිතව විෂයන් 06 ක සාමාර්ථය සමඟ පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය.

   1.2 ගිනි නිවීම පිළිබඳ රජයේ හෝ රජයට අනුබද්ධ ආයතනයක, ත්‍රිවිධ හමුදා ගිනි නිවීම් සේවයේ ගිනිහටයෙකු ලෙස අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් ලබා ඇති අයවිය යුතු අතර අයදුම්කරුවන් ත්‍රිවිධ හමුදා ගිනි නිවීම් සේවයේ යෙදී ඇත්නම් එයින් විශ්‍රාම ලබා හෝ නීත්‍යානුකූල ලෙස ඉවත් වී සිටින අය විය යුතුය.

   1.3 බර වාහන පැදවීමට වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර එවැනි වාහන පැදවීමේ අවුරුද්දක පළපුරුද්දක් තිබිය යුතුය.

   1.4 අවම උස මීටර් 1.6 (අඩි 5 අඟල් 3) ද, අවම බර කිලෝ ග්‍රෑම් 56 (රාත්තල් 110) ද විය යුතුය.

   1.5 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
   වයස අවුරුදු 35 ට අඩු අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

   1.6 පූර්ණ වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

2. වෘත්තීය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

   **සැ.යු.** - බර යන්ත්‍ර හෝ මෝටර් වාහන නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම පිළිබඳ දැනුමක් හා ප්‍රථමාධාර සහතිකයක් තිබෙන සහ වයස අවුරුදු 35 ට අඩු අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

<u>කාර්ය ක්ෂේත්‍රය</u>

- පිරිපහදුවේ ඇතිවන හදිසි ගිනි අනතුරු මැඩපැවැත්වීම සඳහා කාර්යක්ෂමව සහ උපරිම දායකත්වය ලබා දිය යුතුය.
- අවශ්‍යතාවය අනුව ගිනි නිවන රථ, ෆෝම් බැග් ටැංකි, ෆෝම් ට්‍රොලි සහ අනෙකුත් ගිනි නිවන උපකරණ භාවිතා කරමින් කාර්යක්ෂමව ගිනි නිවීම සහතික කිරීම.
- ගිනි නිවන රථ, ගිනි නිවන උපකරණ, ගිනි නිවන පද්ධති, ගිනි නිවන පොම්ප ආදිය නිසි පරිදි නඩත්තු කිරීම සඳහා සහාය සැපයීම.

..02

- ගිනි නිවන රථ, ගිනි නිවන උපකරණ, ගිනි නිවන පද්ධති, ගිනි නිවන පොම්ප ආදිය පිළිබඳ නිත්‍ය හා කාලානුරූප පරීක්ෂණ සිදු කිරීම.
- අවශ්‍යතාවය අනුව කාර්යක්ෂම ප්‍රථමාධාර ලබා දීම.
- අවශ්‍යතාවය අනුව ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.
- ගිනි නිවීමේ අණදෙන නිලධාරියා, පොදු සේවා මුර අධිකාරී, ගිනි හා ප්‍රවේසම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හෝ මුර නායක (ගිනි) ගේ උපදෙස් අනුව ගිනි හදිසි අවස්ථාවකදී කාර්යක්ෂම ගිනි නිවීම සහතික කිරීම.
- පරීක්ෂණ ගිනි කැඳවීම් සැසි සහ ගිනි නිවීමේ අභ්‍යාස සඳහා කාර්යක්ෂම දායකත්වයක් ලබා දීම.
- හදිසි තෙල් කාන්දුවීම් සහ නළ මාර්ගවල හදිසි තෙල් කාන්දුවීම් අවස්ථාවලදී තෙල් ප්‍රතිසාධන (Recovery) කටයුතු සඳහා කාර්යක්ෂම දායකත්වයක් ලබා දීම.
- පිරිපහදුවේ ප්‍රවේසම් ප්‍රවර්ධන වැඩසටහන් සඳහා කාර්යක්ෂම දායකත්වයක් ලබා දීම සහ ධනාත්මක ප්‍රවේසම් සංස්කෘතියක් වර්ධනය කිරීම සඳහා කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම.

අමතර ප්‍රතිලාභ

සංස්ථාවේ වෛද්‍යාධාර ක්‍රමය යටතේ සාත්තු නිවාස පහසුකම් ඇතුලුව නොමිලේ වෛද්‍යාධාර පහසුකම්, නිවාස ණය පහසුකම්, යතුරුපැදි / ත්‍රී රෝද රථ ණය පහසුකම් යනාදිය හිමිවනු ඇත. සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය සඳහා සේවකයා තම වැටුපෙන් 10% ක ප්‍රමාණයකින් දායක විය යුතු අතර, ඒ සඳහා සංස්ථාවෙන් 15% ක ප්‍රමාණයක් ගෙවනු ලැබේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙනුවෙන් 3% ක ප්‍රමාණයක් සංස්ථාවෙන් ගෙවනු ලැබේ.

<u>අයදුම්කිරීමේ පිළිවෙල</u>

සංස්ථා වෙබ් අඩවියේ (www.ceypetco.gov.lk) පළ කර ඇති පොදු අයදුම්පත්‍රයේ ආකෘතිය භාවිතා කර ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය සමඟ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව විස්තරාත්මක අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුවේ.

රජයේ දෙපාර්තමේන්තුවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතු අතර, ඔවුන් විසින් අදාළ අයුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත්, තම ආයතනයෙන් මුදා හැරීමට ඇති හැකියාව සඳහන් කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 31.08.2026 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

ඉහතින් සඳහන් කර ඇති ආකාරයට පරිබාහිරව යොමු කරන ලද අයදුම්පත් පරීක්ෂා කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**කළමනාකාර අධ්‍යක්ෂ**
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
අංක 609 දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත
කොළඹ 09

2026.08.17

මහි/එස්එන්